•

# සර්ප විෂ වෙදකම කෙරෙහි ජ්‍යොතිෂය හා යන්ත්‍ර මන්ත්‍ර වල දායකත්වය

පාරම්පරික වෛද්‍ය කේ. පී. සෝමපාල

සර්පවිෂ වෙදකමෙහි දී ජ්‍යෝතිෂය රෝගියාගේ සාධ්‍යාසාධ්‍යතාව පරීක්ෂා කිරීම සඳහාත්, දෂ්ටයේ ස්වභාවය තේරුම් ගැනීම සඳහාත්, දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීම සඳහාත්, ඖෂධ සඳහා ද්‍රව්‍ය ලබාගැනීම හා ඖෂධ පිළියෙල කිරීම සඳහාත් ආදී වශයෙන් උපයෝගී කර ගනී.

රෝගීයාගේ සාධ්‍යාසාධ්‍යතාව පරීක්ෂා කිරීමේ දී ජ්‍යොතිෂ්‍යානුකූලව අමෘත කලාව, විෂ කලාව හා මරු කලාව යොදාගන්නා අතර දෂ්ටයේ ස්වභාවය තේරුම් ගැනීමේ දී අමෘත කලාව හා විෂ කලාව වැදගත් වේ. එමෙන් ම දෂ්ට කළ සර්පයා හඳුනා ගැනීම සඳහා ද අමෘත කලාව හා විෂ කලාව අත්‍යවශ්‍ය සාධකයකි. ඖෂධ සඳහා ද්‍රව්‍ය ලබා ගැනීම හා ඖෂධ පිළියෙල කිරීම සඳහා ද ජ්‍යොතිෂයට අනුව වේලාව බලා සුභ හෝරාවක දී පුස ආදී සුභ නැකතකට අනුව, සුභ යෝගයකට අනුව, පිරිතේ ආශිර්වාද ලැබ ගනිමින් කටයුතු සිදුකරයි. මෙහි දී පංචාංග ශුද්ධිය ඇති නැකත සහිතදින වල දී ඖෂධ ලබාගැනීම යෝග්‍ය බව දක්වා ඇත. මීට අමතරව සර්ප දෂ්ඨයෙන් වැලකීම සඳහා ද ජ්‍යොතිෂ වැදගත් වේ. අඟහරුවාදා දිනක කුජ හෝරාවෙන් ගොස් රුක් අත්තන ගසක පොත්ත පිටි අතට ගලවා ගෙන පැමිණ එළිපත්ත උඩ තබා කොටන්න. ඉන් පොට්ටනි හතරක් සාදාගෙන වහලේ කොන් හතරේ එල්ලා තැබීමෙන් සර්පයන් නොපැමිණීම එයට එක් නිදසුනකි. ඖෂධ පිළියෙල කිරීමේ දී ජ්‍යෝතිෂය යොදා ගැනීම සඳහා නිදසුන් පහත පරිදි වේ.

- වන්ත ගුලිය - ගොඩ මානෙල් අලයක් කුජ දිනක ගෙන දළුක් ගහේ සිදුරක් සාදා එහි දමා පියන්පත වසා තබා, ගුරු දින ගෙන දෙහි ඇඹුලින් අඹරා මුං ඇට පමණ ගුලි කර වියළා අවශ්‍ය විට දෙහි ඇඹුලින් හෝ ගෝ මුත්‍රයෙන් දියකර සේවනය කිරීම යෝග්‍යයි.
- රහස් බේත් ගුලිය - සිද්ධි යෝගයෙන් බෝ, නුග, හා ඇහැටු මුල් සියුම්ව කොටා දෙහි ඇඹුලින් අඹරා පවනේ වියළා තබා ගෙන අවශ්‍යවිටක දී යොදා ගනී.

මීට අමතරව විෂ නිල ප්‍රතිකාර සඳහා ද ජ්‍යෝතිෂය වැදගත් වේ. එමෙන් ම යන්ත්‍ර මන්ත්‍ර යෙදීම ද සර්ප විෂ වෙදකමෙහි අංගයකි. විෂ බැස්සවීම, මානසික ශෝධනය, සර්පයන් දෂ්ට කිරීමෙන් වැළකී සිටීම, නිවෙස්වලින් සර්පයන් පිටත් කිරීම හා නිවෙස්වලට පැමිණීම වැළැක්වීම, ඖෂධ ද්‍රව්‍ය ලබා ගැනීම හා ඖෂධ සැකසීමේ දීද යන්ත්‍ර මන්ත්‍ර යොදා ගනී. මානසික ශෝධනය සඳහා යන්ත්‍ර මන්ත්‍ර යොදා ගැනීමේ දී කරඳ අතු, දෙහි අතු, මුරුංගා අතු, දොඩංපනා අතු හා දිවි කඳුරු අතු යොදා ගනී.

විෂ බැස්සවීම සඳහා යොදා ගන්නා යන්ත්‍ර මන්ත්‍ර කිහිපයක් පහත පරිදි වේ.

- ඕං අරෝ කාලී කුලී රාතී නෝජා පාසා පාසා කුණු කුණු කෙයෝඩ් ප්‍රහාරාවඃ - මෙහි දී දෙහි අත්ත භාවිත කරයි.
- ඕං ඕතා කණ්ඩා කරාටා නාග මනි සුං ඉං පුල්ලේ විෂ සුං තෝගතුඃ - මෙහි දී මුරුංගා අත්ත භාවිත කරයි.
- ඕං අල්ලට අසුරුවාං අල්ල පසගුරුවාං අප මුනි තිලෝගුරු සිටි තැනින් විෂ උගුළුවන් පෝඩච්චි පෝ පෝ අඩා පුඩි පෝ - මෙහි දී ගස්ලබු හෝ වෙනත් ඕනෑ ම අත්තක් භාවිත කරයි. එමෙන් ම අල්ලට 7 වරක් මතුරා කිය කියා නැවත මතුරා පොළවට අත තබයි.

ඉහත කරුණු සලකා බලන කල සර්ප විෂ වෙදකමෙහි දී, ජ්‍යෝතිෂය හා යන්ත්‍ර මන්ත්‍ර සමඟ පවතින සම්බන්ධතාවය ඉමහත් බැව් පසක් වේ.